41. අරමුදල සඳහා යොදා ගනු ලබන සියළුම සාමාජිකයින් හා සේවකයින් දණ්ඩ නීති සංග්‍රහයෙහි සඳහන් අර්ථානුකූලව සිය ධූර කාලය තුළ "රාජ්‍ය සේවකයන් " ලෙස සැලකිය යුතු ය. අරමුදලේ සාමාජිකයින් හා සේවකයන් රාජ්‍ය සේවකයන් ලෙස සැලකීම

42. මේ ප්‍රඥප්තියේ සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය. අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව

43. මෙම ප්‍රඥප්තියෙහි අන්‍ය ආකාරයකින් සඳහන් වුවහොත් මිස, අර්ථ නිරූපණ

(i) "පළාත් සභාව" යන්නෙන් වයඹ පළාතේ පළාත් සභාව ද,

(ii) "අමාත්‍යවරයා" යන්නෙන් වයඹ පළාතේ පළාත් සභාවේ නිවාස සහ ඉදිකිරීම් විෂයභාර අමාත්‍යවරයා ද,

(iii) වයඹ නිවාස සහ ඉදිකිරීම් අරමුදලේ "සභාපති " යන්නෙන් වයඹ පළාතේ පළාත් සභාවේ නිවාස සහ ඉදිකිරීම් විෂයභාර අමාත්‍යාංශයේ ලේකම් වරයා ද,

(iv) "ලේකම්" යන්නෙන් වයඹ පළාතේ පළාත් සභාවේ නිවාස සහ ඉදිකිරීම් දෙපාර්තමේන්තුවේ කොමසාරිවරයා ද,

(v) "අරමුදල" යන්නෙන් වයඹ පළාතේ නිවාස සහ ඉදිකිරීම් සංවර්ධන අරමුදල ද,

(vi) "දෙපාර්තමේන්තුව" යන්නෙන් වයඹ පළාත් නිවාස සහ ඉදිකිරීම් දෙපාර්තමේන්තුව ද,

(v) "රාජ්‍ය බැංකුව" යන්නෙන් රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව, ලංකා බැංකුව, මහජන බැංකුව, ජාතික ඉතිරි කිරීමේ බැංකුවද අදහස් කෙරේ.

09-389

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.